**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතිය (අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) - 2018.**

-----------------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතියේ (අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ඒජනස් ෆැන්කයිස් ඩි. ඩිවලොප්මන්ට් අතර 2014 සැප්තැම්බර් 29 දින එළඹී අංක සී.එල්.කේ.1008-01 පි දරන ණය ගිවිසුමේ 3.4.2 (එච්) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ, තිරසාර බව පෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,000 කට සමාන එජඩෝ මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩෝ මිලියන 70 ක් මූල්‍යායනය කිරීමට ඒජන්ස් ෆැන්කයිස් ඩී ඩිවෙලොප්මන්ට් එකඟවී තිබුණි. ඉතිරි රු.මිලියන 3,900 ක වටිනාකම ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යානය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කර තිබුණු අතර, 2018 ජූනි 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව 2022 මැයි 31 දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 ඡේදයෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට සේදවත්ත මාර්ගයෙහි මීටර් 687 ක් පමණක් රු.මිලයන 23.56 ක පිරිවැයක් දරා පුනස්ථාපන කටයුතු නිම කලද, මීටර් 12,292 ක නල ඇතිරීමේදී මාර්ග 05 ක හානි වීම් පුනස්ථාපනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ගෙවීම් කර තිබූ එකතුව රු.මිලියන 402.80 ක 2018 දෙසැම්බර් 31 දිනට කරන ලද වැඩ වල පිරිවැය ලෙස ගිණුම්වලට ගෙන තිබුණි. | 379.24 | සම්පූර්ණ කරන ලද වැඩවල පිරිවැය වැඩියෙන් දැක්වීම | නිසිලෙස අදහස් දක්වා නොමැත. | තත්‍ය වශයෙන් නිමකරන ලද වැඩවල පිරිවැය කරන ලද කාර්යයේ පිරිවැය ලෙස ගත යුතුය. |
| (ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද පරිපාලන වියදම් ව්‍යාපෘතියේ ගිණුම් වලට ගෙන නොතිබූ බවට නිරීක්ෂණය විය. | 5.48 | ව්‍යාපෘතියේ පිරිවැය අඩුවෙන් දැක්වීම | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී දරනු ලැබූ සියළු වියදම් සැලකිල්ලට ගත යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති,රීති සහ රෙගුලාසි සඳහා යොමුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක MOFP/ERD/2007/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 | ප්‍රධාන අවශ්‍යතාවයට අනුකූල නොවීම. | ඉදිරියේදී අනුකූල වීමට පිළිගිතිම්. | නියමකිරීම් වලට අනුකූල විය යුතුය. |

මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුනේ 2019 ජූනි 04 දිනදීය.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සංරචක 05 කින් සමන්විත අතර එනම්, ගොතටුවහි ජලාශය සඳහා අධි පීඩන පොම්පාගාරය ඉදිකිරීම, අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා කිලෝමීටර් 9 ක ප්‍රමාණයක් මෘදු යකඩ ජල නළ හා උපාංග සපයා ඇතිරීම සිදුකිරීම, පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් සහ යන්ත්‍ර උපකරණ සැපයුම් කිරීම සහ සැලසුම් කටයුතු සමාලෝචනය කිරීම් යනාදිය වේ. ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී සංරචකවල සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 10.84 ක් සහ සියයට 11.67 ක අඩු ප්‍රගතියක් පෙන්වා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරිදේශ |
|---|---|---|---|---|
| (අ) අඹතලේ සිට එලිහවුස් ජලාශය දක්වා කිලෝමීටර් 9 ක මෘදු යකඩ ජලනල හා උපාංග සපයා එලීම් කිරීම. | මීටර් 9000 ක නළ එලීම් තුලින් මීටර් 1,316 ක් පමණක් නිමකර ඇත. | කොන්ත්‍රාත් කාලය දීර්ඝ වීමේ හැකියාව | බෙදාහැරීම් වලින් ලැබෙන මුදල් වල හිඟතාවය නිසා තාවකාලිකව වැඩ අත් හිටුවා ඇත | වැඩ සැලැස්ම සංශෝධනය කිරීම සඳහා පිළියම් යෙදිය යුතුය. |
| (ආ) මෘදු යකඩ ජලනල සැපයීම හා ඇතිරීම ඇතුළු ගොතටුව ජලාශය හා අධිපීඩන බලැති පොම්පාගාරය ඉදිකිරීම. | මෙම කොන්ත්‍රාත්තුව 2018 ජනවාරි 04 දින අත්සන් කලද 2018 අගෝස්තු 31 දින දක්වා කොන්ත්‍රාත්කරු විසින් මෙහි කටයුතු ආරම්භ කර නොතිබීම හා 2019 ජූනි 12 දින කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම. | ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ වීමේ හැකියාව | ආරවුල් පැන නැගීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදී. | අමතර වියදම් වළක්වාගනිමින් වැඩ නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ)අඹතලේ නිෂ්පාදන පහසුකම් වල විශ්වාසනීත්වය වැඩි දියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීම | 2018 දෙසැම්බර් 31 දිනට සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැත | අඹතලේ ජල පවිත්‍රාගාරය වැඩි දියුණු කිරීමේ | සැලසුම් කටයුතු වල සුළු ප්‍රමාදයක් පවතින අතර එම ප්‍රමාදය අවම කරගැනීමට | වැඩ කඩිනම් කිරීම සඳහා වැඩ සැලැස්ම සංශෝධනය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රමාදය | කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දී ඇත. | |
| (ඇ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට උපකරණ සහ යන්ත්‍රෝපකරණ සැපයීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර නොමැත. | උපකරණ සැපයීම ප්‍රමාදවීම | අරමුදල් හිඟය නිසා ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද විය. | පිළියම් කල්තියා ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘති කටයුතු ආරම්භ කල දින සිට මාස 52 ක් ගතවී තිබුණද, ණය ලබාදෙන ආයතනය විසින් ලබාදී ඇති එ.ජ.ඩො. 70 ක් වූ මුළු ප්‍රතිපාදන තුලින් 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය සියයට 15.50 ක් නියෝජනය වන එ.ජ.ඩො. මිලියන 10.86 කට සමාන රු.මිලියන 1,693.75 ක මුදලක් බවට නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2018 දෙසැම්බර් 31 දිනට ණය ලබාදෙන ආයතනය විසින් එ.ජ.ඩො. මිලියන 1.5 කට සමාන රු. මිලියන 227.89 ක ට බැඳීම් ගාස්තු අයකර ගෙන තිබුණි. | ණය ලබාදෙන ආයතනය විසින් බැඳීම් ගාස්තු අයකරගැනීමේ හැකියාව | කොන්ත්‍රාත් ප්‍රදානය සහ කොන්ත්‍රාත් පරිපාලනයේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ආධාර ලබාදෙන ආයතනය විසින් අරමුදල් අත්හිටුවා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සමග සමගාමීව කටයුතු කිරීම් සහ ප්‍රතිපාදන උපයෝජන කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) මෘදු යකඩ ජල නළ සැපයීම සහ අධි පීඩන පොම්පාගාරය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2017 සැප්තැම්බර් 19 දින ප්‍රදානය කලද කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2018 අගෝස්තු දක්වා එහි වැඩ ආරම්භ කර නොතිබුණි. එම නිසා, 2019 ජූනි 12 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කර ඇති අතර, 2019 ජූලි 31 දින වන විටත් ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවිධිමත් ලෙස යොදාගැනීම හේතුවෙන් පාඩුවක් දැරීමට සිදුවීම | පවත්නා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමකින් තොරව එම ව්‍යාපෘතියටම නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමට නොහැකිය. | කොන්ත්‍රාත් ප්‍රදානයන්ට පෙර ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන විසින් කොන්ත්‍රාත්කරුවන් ගේ අතීත කාර්යසාධනය හා මූල්‍යමය හැකියාව පිළිබඳව අවධානය |

| | | | |
|---|---|---|---|
| ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, සැලකිය යුතු භෞතික ප්‍රගතියක් නොපෙන්වා තිබියදී ව්‍යාපෘතිය විසින් ඉවත්ව යන කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන.18.37 ක බේරුම්කරණ ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. | | | යොමුකල යුතුය. |
| (ඇ) අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා කි.මී.9 ක දුර ප්‍රමාණයක් මෘදු යකඩ නළ සැපයීම්කර ඇතිරීම් සඳහා වූ කොන්ත්‍රාත්තුව 2016 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 01 දින අවලංගු කර තිබුණි. | පිරිවැය ඉක්මවා යා හැකිය | වැඩ නැවත ආරම්භ කිරීම සඳහා 2019 ජනවාරි 04 වන දින කොන්ත්‍රාත්කරු සමඟ අතිරේක ගිවිසුමකට එලඹීමට ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණි. | 2019 ජූනි 30 දින දක්වා වන විටත් අදාල වැඩ කටයුතු ආරම්භ කර නොතිබීම නිසා කොන්ත්‍රාත්කරුට අවවාද කිරීම අවශ්‍ය වේ. |
| (ඉ) 2018 ජූලි 16 දින වූ ආරවුල් බේරුම්කරණ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය ප්‍රකාර අඹතලේ සිට එලිහවුස් ජලාශය දක්වා කි.මී.09 ක මෘදු යකඩ ජල නළ සපයා එලීමේ කොන්ත්‍රාත්තුවෙහි විදේශ මුදල් හිමිකම ඉල්ලීම් පියවීම ප්‍රමාද වීම මත කොන්ත්‍රාත්කරුට රු.මිලියන 13.66 ක මූල්‍ය ගාස්තු පියවීමට උපදෙස් ලබා දී තිබුණි. | අනවශ්‍ය වියදමකි. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්ත්‍රාත් කොන්දේසි නිසා මෙම වියදම දැරිය යුතුව ඇත. | අනාගතයේදී ව්‍යාපෘති වල මෙවැනි වියදම් ඇතිවීම වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඊ) සැලසුම් සමාලෝචනය කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවා සඳහා වූ කොන්ත්‍රාත්තුව 2016 ජනවාරි මස තුල ප්‍රදානය කර තිබූ අතර 2016 ජූනි 01 දින වැඩ ආරම්භ කර තිබුණි. කෙසේ වුවද උපදේශක විසින් මූලික විශේෂඥයින් නොයෙදවීම වීම තුල 2018 දෙසැම්බර් 31 දින වන විටත් එහි ප්‍රගතිය සියයට 50.42 ක් වූ පැවතිණි. | පිරිවැය ඉක්මවා යාමේ හැකියාව | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද වීම නිසා සමානුපාතිකව ව්‍යාපෘති අවශ්‍යතා අනුව උපදේශන සේවාවෙහි මූලික කාර්ය මණ්ඩලය යොදා ගනු ලබයි. | සංශෝධිත වැඩ සැලැස්ම අනුව කොන්ත්‍රාත්කරුවන් ගේ වැඩ කටයුතු කඩිනම් කිරීමට උපදෙස් දිය යුතු අතර සහ කොන්ත්‍රාත් කටයුතු සමීපව සුපරීක්ෂණය කළ යුතු වීම. |

### 3.3 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2010 ජූලි 26 දිනැති කළමණාකරන විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05 අනුව, ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත්ව නොතිබුණි. | මූල්‍ය පාලනයන් දුර්වල වනු ඇත. | පිළිගතිමි. | නියමයන් පරිදි අදාල කරගත යුතුය. |